FORB Learning Platform

# Script: The contents of Freedom of Religion or Belief – Parents and children

# ආගම ඇදහීමට හෝ විශ්වාස දැරීමට ඇති නිදහසඃ මවුපියන් සහ දරුවන්

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 18 වැනි වගන්තියෙන් මව්පියන්ට සහ දරුවන්ට ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස හා සම්බන්ධව විශේෂිත අයිතිවාසිකම් සඳහා විධිවිධාන සලසා තිබෙනවා.

තමන්ගේ විශ්වාස හා අනුකූල වන පරිදි තමන්ගේ  දරුවන්ගේ ආගමික හා සදාචාර අධ්‍යාපනයය ලබාදීමට සහ තමන්ගේ පවුල් ජීවිතය සංවිධානය කරගැනීමට මවුපියන්ට සහ නිත්‍යනුකූල භාරකරුවන්ට අයිතිය තිබෙනවා.

මානව හිමිකම් තිබෙන්නේ  වැඩිහිටියන්ට පමණක් නොවේ!  දරුවන්ටත් ආගම්  ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සඳහා අයිතිය තිබෙනවා - උදාහරණ වශයෙන්, ආගමික හෝ විශ්වාස ප්‍රජා ජීවිතයේ කොටස්කරුවකු වීම සඳහා සහ ආගමික උත්සව හෝ වන්දනාමාන සඳහා සහභාගිවීම සඳහා ඇති අයිතිය සලකන්නට පුළුවනි.

ඒ වාගේම, තමන්ගේ මව්පියන් හෝ භාරකරුවන්ගේ කැමැත්ත අනුව ආගමික අධ්‍යාපනය සඳහා ප්‍රවේශවීමේ  අයිතිය දරුවන්ට තිබෙනවා. ඔවුන්ගේ මවුපියන්ගේ කැමැත්තට පටහැනිව පාපොච්චාරණමය ආගමික කටයුතු සඳහා සහභාගීවීමට ඔවුන්ට බල කළ නොහැකියි. ළමයින් පරිණත වනවිට ඔවුන්ගේ අදහස් හා කැමැත්ත ද වැඩි වැඩියෙන් සැලකිල්ලට ගතයුතු වනවා.

මෙම අයිතිවාසිකම් උල්ලංඝනයවීම් සඳහා බොහෝ උදාහරණ තිබෙනවා.  මධ්‍යම ආසියාවේ රටවල්වල සෝවියට් අතීතයේ උරුමයක් වශයෙන් එම රජයන් සමාජයේ සෑම පැතිකඩක්ම පාලනය කිරීම සඳහා උත්සාහ කරනවා. උදාහරණ වශයෙන්,  ටජිකිස්තානයේ වයස අවුරුදු 18ට අඩු අයට අවමංගල්‍යය උත්සව සඳහා සහභාගිවීම හැර අනෙකුත් ආගමික වන්දනාමාන සහ සිදුවීම් සඳහා සහභාගිවීම තහනම් කර තිබෙනවා.  අනෙකුත් මධ්‍යම ආසියානු රටවල්වල පල්ලියට හෝ ක්‍රිස්තියානි දේවස්ථානයට නොයාම හේතුවෙන් හෝ ගිම්හාන කඳවුරු වැනි ක්‍රියාකාරකම් සඳහාඳහා සහභාගි වීම හේතුවෙන් පාසල් යන වයසේ දරුවන් ප්‍රශ්න කිරීමට හෝ හිංසාවට ලක් කිරීමට රජයන් විසින් කටයුතු කළ අවස්ථා මෙන්ම ළමුන් පාසල් තුළ ප්‍රසිද්ධියේ තරවමවටු කිරීමට ලක් කළ අවස්ථා තිබෙනවා.

ඉතින්,  ඇතැම් ආණ්ඩු ළමයින් විසින් ආගම ප්‍රගුණ කිරීම වලළක්වනවා.  තවත් ආණ්ඩු පසුකාලීනව ඔවුන්  බහුතර ආගමට මාරු කර ගැනීමේ අරමුණින් ඇතිව සුළුතර කණ්ඩායම්වල ළමයින්ට බහුතර ආගම සම්බන්ධයෙන් ලබා දෙන උපදෙස්වලට සහභාගි වන මෙන් බල කරනවා.  න්‍යායාත්මකව පමණක් නොව ප්‍රායෝගිකව ද පාපොච්චාරණමය ආගමික කටයුතුවලින් නිදහස්වීම සඳහා දරුවන්ට ඇති අයිතිය සහතික කිරීමට රජයට වගකීමක් තිබුනද ඒ නොතකා මේවා සිදු වනවා.

යම් යම් ප්‍රතිසංස්කරණ ඇති වී තිබුණ ද තුර්කියේ ආගමික සංස්කෘතික හා සාරධර්ම විෂයමාලාව හා පාඨ ග්‍රන්ථවල තවමත් පාපොච්චාරණමය ආගමික උපදෙස් ඇතුළත් වී තිබෙනවා. යුදෙව් සහ ක්‍රිස්තියානි ශිෂ්‍යයින් න්‍යායාත්මකව මෙයින් නිදහස් ලබා ඇති බව කීවද ප්‍රායෝගිකව එය ක්‍රියා ක්‍රියාත්මක කිරීම දුෂ්කර හෝ කළ නොහැකි වී තිබෙනවා. අළෙවි, බහායි, අදේවවාදී හෝ නාස්තිකවාදී පවුල්වල දරුවන් හෝ තමන්ගේම විශ්වාස පිළිපදින ශිෂ්‍යයින්ට ද මෙම පන්ති සඳහා සහභාගි වීමට

බල කරනු ලබනවා. මේ සියලුම උදාහරණ තුළ  මවුපියන්ගේ සහ දරුවන්ගේ යන දෙපාර්ශ්වයේම අයිතිවාසිකම් උල්ලංඝනය වනවා.

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සම්මත කිරීමට පෙර, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය ඇත්ත වශයෙන්ම දරුවාගේ අයිතිවාසිකම් ගැන විශේෂයෙන් සාකච්ඡා කළේ නැහැ. ළමයින් අයිතිවාසිකම් දරන්නන් ලෙසත්, 14 වන වගන්තියෙන්ත්, ආගමේ හෝ විශ්වාසයේ නිදහසට අයිතියක් ඇති බව අවධාරණය කරමින්, සමුළුව එය වෙනස් කළා.

14 වන වගන්තිය මගින් දරුවන් ස්වාධීන හා අවදානමට ලක්විය හැකි අය වශයෙන් හඳුනාගන්නා අතර, විශේෂයෙන්ම රජය සම්බන්ධයෙන්, ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සඳහා ඔවුන්ගේ අයිතිය ක්‍රියාත්මක කරන විට දෙමාපියන්ගේ උපකාරය හා මගපෙන්වීම අවශ්‍ය වන බව සඳහන් කරනවා.

ඔම් සියලු කාරණා මෙහෙයවිය යුතු මූලධර්මය වන්නේ දරුවාගේ යහපත වන බව සමුළුවේ සඳහන් වනවා. ළමයින්ට බලපාන සියලු කාරණා සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ද එය අවධාරණය කරනවා. කොහොමනමුත්, බොහෝ විට දරුවාගේ යහපත ගැන නිගමනයකට එළඹෙන්නේ සහ ඒ වෙනුවෙන් හඬ නගන්නේ වැඩිහිටියන්, විශේෂයෙන්ම දෙමව්පියනුයි.

ඒත්, ඇතැම් වේලාවල දරුවන්ගේ සහ දෙමාපියන්ගේ අවශ්‍යතා වෙනස් වන්නට පුළුවනි. එවැනි අවස්ථා වලදී, දරුවන්ට ඇති ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිය, දෙමව්පියන්ගේ එම අයිතිය සමගින් සමතුලිත කළ යුතුයි.

නිදසුනක් වශයෙන්, ආගමික වත්පිළිවෙත් හෝ විශ්වාස පිළිබඳව තමන්ගේම තීරණ ගන්නට දරුවෙකුට අයිතිය ලැබෙන්නේ කුමන වයසේදීද? උදාහරණයක් ලෙස, තමන් පල්ලියට යාමට අවශ්‍යද යන්න දරුවෙකුට තීරණය කරන්න පුළුවන් කුමන වයසේදී ද?

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව, ආගම හෝ විශ්වාසය පිළිබඳ කාරණාවලදී දෙමාපියන්ගේ මඟ පෙන්වීම දරුවාගේ වර්ධනය වන හැකියාවන්ට අනුකූල වන පරිදි ලබා දිය යුතු වනවා. ඒ කියන්නේ, දරුවෙකු වැඩිහිටි හා පරිණත වත්ම ඔවුන්ට වැඩි නිදහසක් තිබිය යුතුයි.

වැඩිහිටිභාවය සම්බන්ධයෙන් ඇති ජාත්‍යන්තර නෛතික ප්‍රමිතිය වයස අවුරුදු 18 වන නමුත්, ළමයා කෙමෙන් වයසින් වැඩෙත්දී ඔවුන්ට කොපමණ ස්වාධීනත්වයක් සහ මානසික පරිණතභාවයක් ලැබේද කියන කාරණය සංස්කෘතිය හා පසුබිම අනුව වෙනස් වනවා. විවිධ රටවලට විවිධ නීති රෙගුලාසි තිබෙනවා. නිදසුනක් වශයෙන් ස්වීඩනයේ වයස අවුරුදු 12 සිට ළමයින් ඔවුන්ගේ කැමැත්තට පටහැනිව ආගමික ප්‍රජාවක සාමාජිකයෙකු බවට පත් කළ නොහැකියි.

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මගින් දෙමව්පියන් දරුවන් ඇති දැඩි කරන ආකාරය පිළිබඳ විශ්වීය සම්මතයක් ස්ථාපිත කරනවා - ආගමක් හෝ විශ්වාසයක් පිළිපැදීම දරුවෙකුගේ ශාරීරික හෝ මානසික සෞඛ්‍යයට හෝ සංවර්ධනයට හානියක් නොකළ යුතු බව එහි සඳහන් වනවා.

දෙමව්පියන්ගේ ආගමික නිදහස හෝ විශ්වාසයට එරෙහිව දරුවාගේ අයිතිවාසිකම් හා සම්බන්ධ නඩු උසාවියට පැමිණෙන්නේ කලාතුරකින්. කෙසේ වෙතත්, තම දරුවන්ට රුධිර පාරවිලයනය කිරීම වැළැක්වීමට යෙහෝවාගේ සාක්ෂිකරුවන්ට ඇති අයිතිය, ආගමික හෝ විශ්වාසයේ නිදහස සඳහා දෙමව්පියන්ගේ අයිතිවාසිකම්වලට එරෙහිව සහ දරුවාගේ ජීවන අයිතියට පක්ෂව අධිකරණය විසින් තීන්දු ලබාදීම සඳහා එක් උදාහරණයක් වනවා.

සාරාංශයක් ලෙස කියනවානම්, මේ වීඩියෝ පටයේ අපි මවුපියන් සහ දරුවන්ගේ අයිතිවාසිකම් සලකා බැලුවා.

ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සඳහා දරුවන්ට අයිතියක් තිබෙන අතර, ඔවුන්ගේ විශ්වාසයන්ට අනුකූලව තම දරුවන් ඇති දැඩි කිරීමට දෙමාපියන්ට අයිතියක් තිබෙනවා. මෙය කළ යුත්තේ දරුවා ක්‍රමයෙන් පරිණතභාවයට පත්වන ආකාරය සමගින් අනුකූල වන ලෙස සහ ආගමක් හෝ විශ්වාසයක් පිළිපැදීම දරුවෙකුගේ ශාරීරික හෝ මානසික සෞඛ්‍යයට හෝ සංවර්ධනයට හානියක් නොවන ලෙසයි. ළමයින්ට ආගම ඇදහීම තහනම් කරන රජයන් සහ සුළුතර ආගමික කණ්ඩායම්වල දරුවන් මත බහුතර ආගමික උපදෙස් බලයෙන් පටවන රජයන් උල්ලංඝන සඳහා උදාහරණ ලෙස ගතහැකියි.

මේ සම්බන්ධයෙන් සඳහන් වන මානව හිමිකම් ලේඛන ද ඇතුළුව, ආගම ඇදහීම හා විශ්වාස දැරීමට අදාළව මවුපියන්ට හා දරුවන්ට හිමි අයිතිවාසිකම් සම්බන්ධයෙන් වැඩි විස්තර, වෙබ් අඩවියේ ඇති පුහුණු ද්‍රව්‍ය වලින් ඔබට සොයාගත හැකි වේවි.

Copyright: SMC 2018